සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බෝසතාණන් වහන්සේ මව්කුස පිළිසිඳ ගත්තේ කුමන පොහෝ දිනකද?

(i) වෙසක් (ii) පොසොන් (iii) ඇසල

02 බෝසතාණන් වහන්සේ ''අග්ගෝ හමස්මි ලෝකස්ස'' යනුවෙන් ප්‍රකාශ කළේ,

(i) 'මම ලොවට අග්‍ර වෙමි' යන්නයි.

(ii) 'මම ලොවට ජ්‍යෝෂ්ඨ වෙමි' යන්නයි.

(iii) 'මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි' යන්නයි.

03 බෝසත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට කැඳවූ බමුණු පඬිවරුන් ගණන,

(i) 108 කි. (ii) 8 කි. (iii) 7 කි.

04 බුදුබව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැයි සිදුහත් තාපසතුමාගෙන් ඉල්ලා සිටියේ,

(i) සුද්දෝධන රජතුමා ය. (ii) බිම්බිසාර රජතුමා ය. (iii) සුප්‍රබුද්ධ රජතුමා ය.

05 බෝසතාණන් වහන්සේට මධ්‍යම යාමයේ දී පහළ වූයේ,

(i) පුබ්බේනිවාසානුස්සති ඤාණයයි.

(ii) චුතූපපාත ඤාණයයි.

(iii) අසවක්ඛය ඤාණයයි.



LIVEWORKSHEETS

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

06 මහ බෝසතාණන් වහන්සේ මව්කුසින් බිහිවූයේ ලුම්බිණි නම් සල් උයනේදී ය. ( )

07 සුද්දෝදන රජතුමා තම පුතුට මුලින් ම වැන්දේ වප් මඟුල් උළෙල පැවැත්වූ දිනයේදී ය. ( )

08 සිදුහත් කුමරු සරණ පාවාගත්තේ සුප්‍රබුද්ධ රජුගේ දියණියයි. ( )

09 අනෝමා ගංතෙරේ දී සිදුහත් කුමරුට සිවුරු පිරිකර ලබාදුන්නේ සහම්පතී බ්‍රහ්මයා ය. ( )

10 පුද්ගලයකුගේ දියුණුව සඳහා උපකාරී වන කරුණු හයක් අන්ථස්සද්වාර ජාතකයෙහි පෙන්වා ඇත. ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති වගන්තිවල හිස්තැනට සුදුසු වචන වරහන තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

11 මහා මායා දේවිය ඇතුළු පිරිස අලංකාර පෙරහැරකින් තම මව්පියන් ජීවත් වන .................................. නුවර බලා යාමට පිටත් විය. (කිඹුල්වත් / දෙව්දහ)

12 බෝසත් කුමරු ඉපදුණේ ............................................................................ පොහෝ දිනකය. (වෙසක් / ඇසල)

13 සිදුහත් කුමරු ශිල්ප ඉගෙන ගත්තේ .................................. නම් බමුණු පඬිවරයාගෙන් ය. (අසිත / සර්වමිත්‍ර)

14 පන්සලට ගොස් මුලින්ම වන්දනාමාන කළ යුත්තේ ...................................................... වහන්සේට ය. (වෙහෙර / බෝධීන්)

15 ............................................................................................ ගාථා නවයකින් බුදු සිරුර වර්ණනා කළාය. (යසෝදරා දේවිය / කිසාගෝතමී කුමරිය)

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශවල දැක්වෙන හිස්තැන් වරහන් තුළින් නිවැරදි වචන තෝරාගෙන සම්පූර්ණ කරන්න.**

(සොත්ථිය / භග්ගව / කාලදේවල / කාළුදායි / සහම්පතී / ඡන්න / ආලාරකාලාම / සටීකාර)

16 ............................................................................................ මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවිවරු දේවාරාධනාව කළහ.

17 සිදුහත් කුමරු දැකීමට පැමිණි පළමුව සිනාසී දෙවනුව හැඬුවේ ........................................................... තවුසා ය.

18 සිදුහත් බෝසතාණන් වහන්සේට කුස තණ අට මිටක් පූජා කළේ ...................................................... බමුණා ය.

19 රජසැප හැරදමූ සිදුහත් කුමරු මාලිගයෙන් නික්ම ගියේ ........................................................... ඇමති සමග ය.

20 අභිනිෂ්ක්‍රමණයෙන් පසු සිදුහත් බෝසතාණෝ පළමුව ධර්මය ඉගෙන ගැනීමට පැමිණියේ ............................................................... තවුසා වෙතය.

(ලකුණු 2 x 20 = 40)



LIVEWORKSHEETS